දත්ත ආරක්ෂණ අධිකාරිය
தரவுப் பாதுகாப்பு அதிகாரசபை
Data Protection Authority

First Floor, Block 5, BMICH, Bauddhaloka Mawatha, Colombo 07, Sri Lanka.
Tel: +94 (0)112697241, Email: info@dpa.gov.lk, Web: www.dpa.gov.lk

මගේ අංකය: DPA/Legal/01/02 දිනය: 2026 අගෝස්තු 07

පෞද්ගලික දත්ත ආරක්ෂණ චක්‍රලේඛ: අංක 01/2026

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු
සියලුම කොමිෂන් සභා සභාපතිවරු
පළාත් ප්‍රධාන ලේකම්වරු
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරු
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන සභාපතිවරු,
රාජ්‍ය සමාගම් හා රජයට අයත් ව්‍යාපාරවල සභාපතිවරු

2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත (2025 අංක 22 දරන පනත මඟින් සංශෝධිත) රාජ්‍ය අංශයට අදාළ වීම

1.0 පසුබිම

1.1 2022 මාර්තු 19 දින සිට බලාත්මක වූ 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත (මින් මතු "පනත")[1], මඟින් එහි පූර්විකාවේ දක්වා ඇති පරිදි ඩිජිටල් ආර්ථිකයක් තුළ වර්ධනය සහ නවීකරණය සඳහා පහසුකම් සැලසීමේ නියාමන රාමුව සලසමින් නොයෙක් ගණුදෙණු සහ සන්නිවේදනයන්හි නියැලී සිටින දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමට අවශ්‍ය යාන්ත්‍රණ සපයනු ලබයි.

1.2 මෙම පනත මඟින් "පෞද්ගලික දත්ත" එනම් "දත්ත දායකයකු" ලෙසින් හැඳින්වෙන ස්වභාවික පුද්ගලයෙකු සෘජුව හෝ වක්‍රව හඳුනාගත හැකි ඕනෑම තොරතුරක් සැකසීම නියාමනය කරයි. පුද්ගලික දත්ත රැස් කිරීම, ගබඩා කිරීම, සුරැකීම, උපයෝජනය, සම්ප්‍රේෂණය කිරීම මෙන්ම මකා දැමීම හෝ ඒවා මත තාර්කික හෝ අංකමය මෙහෙයුම් සිදු කිරීම වැනි පුළුල් පරාසයක ක්‍රියාකාරකම් ආවරණය කෙරෙන පරිදි "දත්ත සැකසීම" යන්න නිර්වචනය කර ඇත. රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශයේ ආයතන යන දෙ අංශයෙන්ම සේවා සැපයීමේ දී ඇතිවිය හැකි ඕනෑම අහිතකර බලපෑමකින් "දත්ත දායකයන්ගේ" තොරතුරුවල පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම මෙම පනත මඟින් සිදු කෙරේ. "දත්ත දායකයන්" යන නිර්වචනයට අනුව පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත යටතේ පුරවැසියන් සහ පුරවැසියන් නොවන පුද්ගලයින්ගේ පෞද්ගලික දත්ත සමාන අන්දමින් ආරක්ෂා කර ඇත. ("දත්ත දායකයන්" ගේ අයිතිවාසිකම් මෙම පනතේ II කොටසෙහි දක්වා ඇත).

1.3 පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත ශක්තිමත් කිරීමටත්, සියලුම ක්ෂේත්‍ර පුරා දියුණු තාක්ෂණික ක්‍රම සහිතව එය පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීමටත් හැකියාව ලැබෙන පරිදි 2025 අංක 22 දරන පෞද්ගලික

[1] පනත http://documents.gov.lk/files/act/2022/3/09-2022_S.pdf යන යොමුවෙන් බාගත කළ හැකි ය.

දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත බලාත්මක කර ඇත. රාජ්‍ය සහ පෞද්ගලික අංශයට මේඝ තාක්ෂණ උපායමාර්ග (Cloud first) අනුගමනය කිරීමට ඇති හැකියාව, දත්ත ආරක්ෂණ නිලධාරී (DPO) කාර්යභාරය බාහිර පාර්ශවයන් වෙත පැවරීමේ හැකියාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ආරක්ෂා කර ඇති අයිතිවාසිකම්වලට (සමානත්වයට ඇති අයිතිය සහ වෙනස්කොට සැලකීමට ලක්නොවීමට ඇති අයිතිය වැනි) බලපෑම් ඇති කරන අවස්ථා ඇතුළත් වන පරිදි ස්වයංක්‍රීය තීරණ සමාලෝචනය කිරීම (18 වැනි වගන්තිය), සහ පනතේ 2 සහ 3 වගන්ති මෙන්ම 1 , 2 , 3 සහ 7 වැනි කොටස (දඬුවම්) ඇතුළුව, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත ක්‍රියාත්මක වන දිනයන් අදියර වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට ඉඩ සැලසීම වැනි කරුණු 2025 සංශෝධන මඟින් හඳුන්වා දී ඇති ප්‍රධාන අංග අතර වේ. 12(2) වගන්තිය යටතේ මාර්ගෝපදේශ මෙන්ම ආංශික මාර්ගෝපදේශ නිකුත් කිරීමටත්, ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව දත්ත දායකයෙකුගේ අයිතිවාසිකම් ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීම සඳහා වඩාත් පැහැදිලි කාලසීමාවන් පැනවීමටත් නව 51 (අ) වගන්තිය මඟින් දත්ත ආරක්ෂණ අධිකාරියට බලය ලබා දෙයි. දත්ත දායකයෙකුගේ ඉල්ලීමක් සඳහා කිසිදු ගාස්තුවක් අය නොකළ යුතු අතර, නීති මඟින් නිශ්චිතව දක්වා ඇති නිර්ණායක මත පදනම්ව සුවිශේෂී අවස්ථාවන්හිදී පමණක් ගාස්තු අය කළ හැකි බව කාරුණිකව දන්වමි.

1.4 දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත සැකසීම හා පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත (PDPA) මඟින් නියාමනය කරනු ලබන ආයතන "පාලකවරයන්" සහ "සකසන්නන්" ලෙස හැඳින්වේ. පෞද්ගලික දත්ත සැකසීමේ අරමුණු සහ ක්‍රමවේදයන් මූලික වශයෙන් තීරණය කරන ආයතන ලෙස, පනතේ 1 වන කොටස යටතේ ඇති සැකසුම් බැඳීම්වලට අනුකූල වීමේ අවශ්‍යතාවය ද ඇතුළුව, "පාලකයන්" වෙත පනවා ඇති නීතිමය බැඳීම් කිහිපයක් පවතී. අනෙක් අතට, "සකසන්නන්" යනු පාලකයෙකු වෙනුවෙන් ඇතැම් පුද්ගලික දත්ත සැකසීමේ කාර්යයන් සිදු කිරීම සඳහා පාලකයෙකු විසින් ගිවිසුම්ගත කරනු ලබන පාර්ශවයන් වේ. "පාලකයා" යන නිර්වචනයට රාජ්‍ය අධිකාරියක්, රාජ්‍ය සංස්ථාවක්, තනිව හෝ වෙනත් අය සමඟ ඒකාබද්ධව පුද්ගලික දත්ත සැකසීමේ අරමුණු සහ ක්‍රමවේදයන් තීරණය කරනු ලබන ඕනෑම ස්වාභාවික හෝ නීතිමය පුද්ගලයෙකු ඇතුළත් වේ. (පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ "සකසන්නා" සඳහා වන නිර්වචනය බලන්න, එහි පැහැදිලි කිරීමක් ඇතුළත් වේ)

1.5 පුද්ගලික දත්ත සැකසීම සම්පූර්ණයෙන්ම හෝ කොටසක් ශ්‍රී ලංකාව තුළ සිදුවන විට, හෝ ශ්‍රී ලංකාව තුළ සිටින පුද්ගලයෙකු හෝ ආයතනයක් විසින් එය සිදුකරන විට පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත දේශීය වශයෙන් බලපැවැත්වෙන අතර ශ්‍රී ලංකාවෙන් පිටත සිටින පුද්ගලයෙකු හෝ ආයතනයක් විසින් ශ්‍රී ලංකාව තුළ සිටින "දත්ත සකසන්නන්" වෙත විශේෂයෙන්ම භාණ්ඩ හෝ සේවාවන් සපයන්නේ නම් හෝ ශ්‍රී ලංකාව තුළ සිටින ඔවුන්ගේ හැසිරීම් නිරීක්ෂණය කරන්නේ නම්, මෙම පනත විදේශීය වශයෙන් ද බල පැවැත්වේ.

1.6 පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ 3(1) වගන්තියට අනුව, දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමට අදාළව, වෙනත් ඕනෑම ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද, එය නොතකා පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතුය. එසේ වුවද, පොදු අධිකාරියක් වෙනත් යම් ලිඛිත නීතියක් මඟින් පාලනය වන අවස්ථාවක, මේ පනත සමඟ අනුකූලවනතාක් දුරට, එකී අධිකාරිය විසින් දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත එකී ලිඛිත නීතියේ විධිවිධානවලට අනුකූලව සැකසීම නීත්‍යානුකූල විය යුතු ය. කෙසේ වුවද, මේ පනතේ විධිවිධාන හා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් අනනුකූලතාවක් ඇති අවස්ථාවක පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතුය.

2.0 පනත අදියර වශයෙන් බලාත්මක කිරීම

2.1 පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ලැබී ඇති බලතල ප්‍රකාරව තාක්ෂණ අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද නියෝගයක් මඟින් (2023 ජූලි 21 දිනැති අංක 2341/59 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය), 2023 ජූලි 17 දින පනතෙහි V වන කොටස (දත්ත ආරක්ෂණ අධිකාරිය) බලාත්මක වන දිනය ලෙස නම් කරන

ලදි.දත්ත ආරක්ෂණ අධිකාරයෙහි සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය 2023 අගෝස්තු මස දී පත් කිරීමට හැකි වන පරිදි,මෙම නියෝගය නිකුත් කරන ලදි.

2.2 පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත බලාත්මක කිරීමේ දිනයන් 2025 මාර්තු 18 දිනට මුලින් නියම කර තිබූ අතර එය 2024 ජනවාරි 8 දිනැති අංක 2366/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් නිසි පරිදි සංශෝධනය කර ඇත. 2025 අංක 22 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත මඟින් ක්‍රියාත්මක වන දිනයන් නියම කිරීමට අදාළ විධිවිධාන මේ වන විට සංශෝධනය කර ඇති අතර, එමඟින් විවිධ වගන්ති සහ කොටස් අදියර වශයෙන් බලාත්මක කිරීමට අවස්ථාව සලසා දී ඇත. එබැවින්, රාජ්‍ය අංශයේ ආයතන, දත්ත ආරක්ෂණ අධිකාරිය විසින් නිකුත් කරනු ලබන නව බලාත්මක කිරීමේ දිනයන් පිළිබඳව අවධානය යොමු කළ යුතුය. (සටහන - අදාළ පාලන විධිවිධාන බලාත්මක කිරීමෙන් පසුව දත්ත ආරක්ෂණ අධිකාරිය මඟින් පැමිණිලි විමර්ශනය කිරීම, අභියාචනා විභාග කිරීම යනාදිය පමණක් සිදු කරනු ලබයි).

3.0 දත්ත ආරක්ෂණ නිලධරයා

3.1 දත්ත ආරක්ෂණ නිලධාරියෙකු පත් කිරීම, 2025 අංක 22 දරන පනතින් සංශෝධිත 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ III වන කොටස යටතේ ඇති වැදගත් පාලන අවශ්‍යතාවයකි. පනතේ 20 වන වගන්තියට අනුව, පෞද්ගලික දත්ත සකසනු ලබන සෑම අමාත්‍යාංශයක් හෝ රජයේ දෙපාර්තමේන්තුවක් විසින් පනතේ විධිවිධානවලට අනුකූල වීම සහතික කිරීම සඳහා දත්ත ආරක්ෂණ නිලධාරියෙකු පත් කළ යුතුය.

3.2 20(1)(අ) වගන්තිය යටතේ දත්ත ආරක්ෂණ නිලධාරියෙකු පත් කිරීමේ නිර්ණායකවලට රාජ්‍ය සංස්ථා සහ රජය සතු සමාගම් ඇතුළත් නොවුණද, පනතේ 20(1)(ආ) වගන්තිය සහ මෙම විධිවිධානය යටතේ සාදන ලද රෙගුලාසි මඟින් නියම කර ඇති නිර්ණායක අනුව දත්ත ආරක්ෂණ නිලධාරියෙකු පත් කිරීමේ වගකීමක් පැන නැඟිය හැකි බවට අවධානය යොමු විය යුතුය. ඒ අනුව, එවැනි ආයතන තම දත්ත සැකසුම් ක්‍රියාකාරකම් ඇගයීමට ලක් කර, පනත යටතේ දත්ත ආරක්ෂණ නිලධාරියෙකු පත් කිරීම අවශ්‍ය දැයි තීරණය කළ යුතු බවට දිරිමත් කෙරේ. පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත යටතේ "දත්ත ආරක්ෂණ නිලධාරියා" (Data Protection Officer) සඳහා දී ඇති අර්ථ දැක්වීම පිළිබඳවද කාරුණික අවධානය යොමු කෙරේ.

3.3 පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත යටතේ අනුකූලතා වගකීම් පිළිබඳව පාලකයාට හෝ සකසන්නාට උපදෙස් දීම, අවශ්‍ය අවස්ථාවලදී දත්ත ආරක්ෂණ බලපෑම් ඇගයීම් පිළිබඳව උපදෙස් ලබා දීම, දත්ත ආරක්ෂණ අධිකාරිය සමඟ සම්බන්ධීකරණ නිලධාරියෙකු ලෙස කටයුතු කිරීම සහ පෞද්ගලික දත්ත ආරක්ෂණයට අදාළ කරුණු පිළිබඳව ආයතනය තුළ දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම සහ පුහුණු ලබා දීම ඇතුළු, පනතේ 20(5) වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා දත්ත ආරක්ෂණ නිලධාරියා වගකිව යුතු වන්නේය.

3.4 දත්ත ආරක්ෂණ නිලධාරියෙකු පත් කිරීමට අවශ්‍ය වන සෑම අමාත්‍යාංශයක්, රජයේ දෙපාර්තමේන්තුවක් සහ අනෙකුත් රජයේ කාර්යාලයක් විසින්, එසේ පත් කරන ලද දත්ත ආරක්ෂණ නිලධාරියාගේ සම්බන්ධතා තොරතුරු තම නිල වෙබ් අඩවියේ පළ කිරීමටත්, දත්ත දායකයන්ට ඒවා පහසුවෙන් ලබා ගැනීමට හැකිවීම පිළිබඳවත් වගබලා ගත යුතුය. පත් කරන ලද දත්ත ආරක්ෂණ නිලධාරියාගේ නම සහ සම්බන්ධතා තොරතුරු, දත්ත ආරක්ෂණ අධිකාරිය විසින් කලින් කලට නියම කරනු ලබන ආකාරයට එම අධිකාරිය වෙත ද දැනුම් දීමට කටයුතු කළ යුතුය.

3.5 පනත යටතේ පැවරී ඇති වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට සහ ආයතනය තුළ ඵලදායී "දත්ත ආරක්ෂණ කළමනාකරණ වැඩසටහනක්" ක්‍රියාත්මක කිරීමට සහාය වීමත් සඳහා අවශ්‍ය සම්පත්, බලය සහ තොරතුරු වෙත ප්‍රවේශ වීමේ හැකියාව දත්ත ආරක්ෂණ නිලධාරියා වෙත ලබා දෙන බවට සහතික කිරීමට රාජ්‍ය අංශයේ ආයතන දිරිමත් කෙරේ.

4.0 රාජ්‍ය අංශයේ ආයතන සඳහා පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතෙහි බලපෑම

4.1 බොහෝ රාජ්‍ය අංශයේ ආයතන, තම සේවාවන් සැපයීමට අදාළව මෙන්ම තම කාර්ය මණ්ඩලයේ පුද්ගලික දත්ත සැකසීමට අදාළව පෞද්ගලික දත්තවල "පාලකවරුන්" ලෙස කටයුතු කරන බැවින්, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ ප්‍රතිපාදන බලාත්මක කිරීම සඳහා සුදුසු තාක්ෂණික සහ ආයතනික පියවර ගත යුතුය. 2025 පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනතට අනුව, "පොදු අධිකාරිය" යන්නෙන් අදහස් කරනුයේ, අමාත්‍යාංශයක්, ඕනෑම දෙපාර්තමේන්තුවක් හෝ පළාත් සභාවක්, පළාත් පාලන ආයතනයක්, හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක්, හෝ දෙපාර්තමේන්තුවක් වේ.

4.2 'පාලකවරයෙකු' යන භූමිකාව යටතේ ක්‍රියා කරන සියලුම රාජ්‍ය අධිකාරීන් විසින් පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ I වන කොටස යටතේ දක්වා ඇති දත්ත සැකසීමේ වගකීම්වලට අනුකූලව පෞද්ගලික දත්ත රැස් කිරීම සහ සැකසීම සහතික කළ යුතුය. එම දත්තවල නීත්‍යානුකූලභාවය (5 වගන්තිය), අරමුණ නිශ්චිතව දැක්වීම (6 වගන්තිය), අරමුණ සීමා කිරීම (7 වගන්තිය), නිරවද්‍යතාව පවත්වා ගැනීම (8 වගන්තිය), රඳවා තබා ගැනීමේ කාලසීමාව සීමා කිරීම (9 වගන්තිය), විශ්වාසනීයත්වය සහ රහස්‍යභාවය පිළිබඳ වගකීම් (10 වගන්තිය) සහ පාරදෘශ්‍යභාවය (11 වගන්තිය) සම්බන්ධයෙන් දක්වා ඇති වගකීම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

4.3 පොදු අධිකාරින් විසින් පනතෙහි 12 වැනි වගන්තිය යටතේ දක්වා ඇති ඵලදායී "දත්ත ආරක්ෂණ කළමනාකරණ වැඩසටහනක්" (Data Protection Management Program) හරහා ඉහත වගකීම්වලට අනුකූලවීම සඳහා වන වගවීම සහතිකකිරීමද කළ යුතු වේ. පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ II කොටස යටතේ දක්වා ඇති දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීමත් මෙයට ඇතුළත් වේ.

4.4 සුදුසු "දත්ත ආරක්ෂණ නිලධාරියෙකු" පත් කිරීම වැනි III වන කොටස යටතේ දක්වා ඇති අතිරේක වගකීම්වලට සෑම ආයතනයක්ම අනුකූල විය යුතු අතර (20 වගන්තිය), පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ 24 වන වගන්තිය යටතේ දක්වා ඇති පරිදි, අවශ්‍ය අවස්ථාවලදී ඇතැම් පෞද්ගලික දත්ත සැකසීමේ ක්‍රියාකාරකම් සඳහා දත්ත ආරක්ෂණ බලපෑම ඇගයීම් සිදු කළ යුතුය. විශේෂිත සැකසුම් ක්‍රියාකාරකම් සඳහා දත්ත ආරක්ෂණ බලපෑම ඇගයීමක් සිදු කරන ආකෘතිය හා ආකාරය පිළිබඳ දළ සටහනක් දත්ත ආරක්ෂණ අධිකාරියේ වෙබ් අඩවිය තුළ දක්වා ඇත. දත්ත කඩකිරීම් දැනුම් දීම පිළිබඳ කෙටුම්පත් රීති ද දත්ත ආරක්ෂණ අධිකාරියේ වෙබ් අඩවියේ ඇත.

4.5 පාලකවරයා වෙනුවෙන් පෞද්ගලික දත්ත සැකසීම සඳහා ඔහු විසින් බඳවා ගනු ලබන ගිවිසුම්ගත තෙවන පාර්ශවයක්, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත යටතේ "සකසන්නෙකු" (processor) ලෙස සලකනු ලබයි. පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට අනුකූලවීම පිළිබඳ පාලකවරයාට සහාය වීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහ සංවිධානාත්මක හැකියාවන් සහිත "සකසන්නන්" පමණක් තෝරා ගැනීමට ඉදිරියේදී රාජ්‍ය අංශයේ ආයතන විසින් කටයුතු කිරීමට වගබලා ගැනීම අවශ්‍ය වනු ඇත.

4.6 පෞද්ගලික දත්ත සැකසීම සඳහා දේශසීමා හරහා දත්ත සංචලනය (මෙස සේවාවන් භාවිතා කිරීමේ හැකියාව) සම්බන්ධයෙන් මීට පෙර යම් සීමාවන් පැවතුනද, 2025 අංක 22 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත මඟින් දේශසීමා හරහා දත්ත හුවමාරු කිරීම්වල නිරත වීමට "පාලකවරයෙකුට" අභිමතය ලබා දී ඇත. මෙම සංශෝධනයේ ප්‍රතිඵලය වන්නේ, ඩිජිටල් පරිණාමය වේගවත් කරන, පිරිවැය-ඵලදායී, පරිමාණය මැනිය හැකි දත්ත ගබඩා කිරීම සහ සැකසීම සඳහා ගෝලීය මෙඝ ධාරිතා (cloud) යටිතල පහසුකම්වලින් ප්‍රයෝජන ගැනීමට පොදු අධිකාරීන්ට මෙන්ම පෞද්ගලික අංශයටද සමාන අවස්ථාවක් දැන් ලැබී තිබීමයි. එමෙන්ම, දේශසීමා හරහා දත්ත පැවරීම්වල නිරත වන සියලුම පාලකවරයන් සහ සකසන්නන් විසින් 26(2) වගන්තිය යටතේ දක්වා ඇති බැඳීම සහ බලාත්මක කළහැකි නීතිමය ලියවිලිවලට අනුගතව කටයුතු කළ යුතු බවද මෙම සංශෝධනය මඟින් නියම කර ඇත. ගිවිසුම්ගත වගන්ති, චර්යා ධර්ම පද්ධති , සහතික කිරීම් , පැවරීමේ බලපෑම ඇගයීම් වැනි නීතිමය ලියවිලි කිහිපයක් අධිකාරිය විසින් දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති මාර්ගෝපදේශ පිළිබඳ කෙටුම්පත මඟින් හඳුනාගෙන ඇත. දත්ත විදේශයන් වෙත

පැවරීමේදී, තුන්වන රටවල සිටින ප්‍රතිග්‍රාහකයන්ගේ බැඳීම් සහ බලාත්මක කළ හැකි කැපවීම් සහතික කිරීම් සඳහා දත්ත දායකයන්ට හා පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත යටතේ ඇති ප්‍රතිකර්මවලට උචිත ආරක්ෂණයන් සහතික වන පරිදි සමාන ආරක්ෂාවක් සහතික කිරීම් සඳහා මෙම නීතිමය ලියවිලි සැලසුම් කර ඇත.

4.7 පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ විධිවිධානවලට නිසි පරිදි අනුකූලවීම් සහතික කිරීම් සඳහා, හැකිතාක් දුරට ආංශික නියාමකයන් සහ අමාත්‍යාංශ ක්‍රියාකාරීව සම්බන්ධ කර ගැනීමේ වැදගත්කම දත්ත ආරක්ෂණ අධිකාරිය විසින් අවබෝධ කරගෙන ඇත. ඒ අනුව, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත මඟින් අවසරය දී ඇති දුරට , මූල්‍ය හා බැංකු, රක්ෂණ, සෞඛ්‍ය, විදුලි සංදේශ, සිවිල් ලියාපදිංචිය සහ සංචාරක ව්‍යාපාරය වැනි පෞද්ගලික දත්ත රැස් කිරීමේ සහ සැකසීමේ නිරත වන ප්‍රධාන අංශ/ක්ෂේත්‍රවල නියෝජිතයන් සමඟ ආංශික ක්‍රියාත්මක කිරීමේ පැතිකඩ පිළිබඳව නිරන්තර සංවාදයක් පවත්වා ගැනීමට දත්ත ආරක්ෂණ අධිකාරිය අපේක්ෂා කරයි. මෙම පනතේ විධිවිධාන යටතේ නිකුත් කරනු ලබන රීති සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ සූදානම් ඉහළ නැංවීම් සඳහා දත්ත ආරක්ෂණ අධිකාරිය විසින් උපදේශක කමිටු පිහිටුවීමට ද අපේක්ෂා කෙරේ.

4.8 දැනුවත් කිරීමේ සහ උසස් සහතික පත්‍ර වැඩසටහන් පිළිබඳ වැඩිදුර තොරතුරු නුදුරු අනාගතයේදී ලබා දෙනු ඇත. දෙපාර්තමේන්තු ප්‍රධානීන්, නීති නිලධාරීන්, දත්ත ආරක්ෂණ නිලධාරීන්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහ මානව සම්පත් කළමනාකරණ විෂය භාර නිලධාරීන් ඇතුළත් වන පරිදි රාජ්‍ය අංශය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පැවැත්වීමට පහසුකම් සැලසීම් සඳහා මෙම අධිකාරිය සැලසුම් සකස් කරමින් සිටියි.

4.9 පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ විධිවිධානවලට අනුකූලවීම් සඳහා වන ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට අදාළ නියෝග/උපදෙස් නිකුත් කරන ලෙසට ඔබගේ පාලනය යටතේ ඇති සියලුම ආයතනවලට දැනුම් දෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි. ඔබේ පහසු පරිශීලනය සඳහා එවැනි ක්‍රියාකාරකම්වලට ඇතුළත් විය හැකි දේ පිළිබඳ නිදර්ශනයක් මෙම චක්‍රලේඛයේ 1 වන ඇමුණුමෙහි දක්වා ඇත.

4.10 සියලු ප්‍රධාන තොරතුරු සහ අදාළ නීතිමය ලියවිලිවලි දත්ත ආරක්ෂණ අධිකාරියේ නිල වෙබ් අඩවිය (URL: https://dpa.gov.lk) තුළ පළ කරනු ඇත. එමෙන්ම, info@dpa.gov.lk යන විද්‍යුත් ලිපිනය හරහා ද දත්ත ආරක්ෂණ අධිකාරිය හා සම්බන්ධ විය හැකිය.

4.11 අංක 01/2024 දරන 2024 සැප්තැම්බර් 13 දිනැති පෞද්ගලික දත්ත ආරක්ෂණ චක්‍රලේඛය තවදුරටත් බල නොපැවෙත්වෙන අතර ඒ වෙනුවට මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන දින සිට බලපැවැත්වෙනු ඇත.

(අත් කලේ./-)
රජීව බණ්ඩාරනායක
සභාපති
දත්ත ආරක්ෂණ අධිකාරිය

පිටපත්:

1. **ජනාධිපති ලේකම්** - **කරු. දැ.ගැ.පි. හා අ.ක.ස.**
2. **අග්‍රාමාත්‍ය ලේකම්** - **,,**
3. **අමාත්‍ය මණ්ඩලයේ ලේකම්** - **,,**
4. **පාර්ලිමේන්තු මහලේකම්** - **,,**

ඇමුණුම 1 – පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට අනුකූල වීම

මූලික පියවර

(1) දැනුවත් කිරීම:
පනතෙහි විධිවිධාන සහ ඒ හා සම්බන්ධ අනුකූලතා අවශ්‍යතා පිළිබඳව කාර්ය මණ්ඩලයේ සියලු දෙනාගේ දැනුවත් බව සහතික කිරීමට පියවර ගැනීම .

(2) පාලන ව්‍යුහය:
පනතට අනුකූලවීම පිළිබඳව අධීක්ෂණය කිරීම සඳහා දත්ත ආරක්ෂණ නිලධාරියෙකු (DPO), රහස්‍යතා ආරක්ෂණ නිලධාරීන් සහ/හෝ අභ්‍යන්තර මෙහෙයුම් කමිටුවක් පත් කර අභ්‍යන්තර පාලන ව්‍යුහයක් සකස් කිරීමට පියවර ගැනීම.

(3) පෞද්ගලික දත්ත විගණනය:
ඔබ ආයතනය සතු පෞද්ගලික දත්ත මොනවාද, ඒවායේ සම්භවය කුමක්ද , ඔබ එම දත්ත හුවමාරු කර ගන්නේ කා සමඟද සහ ඔබ ආයතනය එවැනි දත්ත තබාගන්නේ මන්ද , ඊට සම්බන්ධ ක්‍රියාවලී යන දේ පිළිබඳ කරුණු ලේඛනගත කිරීමට පියවර ගැනීම..

(4) පරතර/ඌණතා තක්සේරුව:
ඔබ ආයතනයේ වර්තමාන දත්ත සැකසුම් ක්‍රියාකාරකම් සහ පනත යටතේ දක්වා ඇති විධිවිධාන අතර ඇති වෙනස්කම් නිශ්චිතව හඳුනා ගන්න. එම වෙනස්කම් ආමන්ත්‍රණය සඳහා පියවර සැලැස්මක් සකස් කිරීම.

(5)ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම:
පනතෙහි දක්වා ඇති විධිවිධානවලට අනුකූලවීමට ආයතනය සඳහා යෝග්‍ය දත්ත ආරක්ෂණ ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම (උදා: දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් සඳහා ප්‍රතිචාර දැක්වීම, දත්ත රඳවා තබා ගැනීම, රහස්‍යතා පිළිබඳ දැනුම්දීම්, කැමැත්ත කළමනාකරණ පුහුණුව යනාදිය.)

(6) පුහුණුව සහ ධාරිතා සංවර්ධනය:
ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් පනතෙන් පැන නගින අනුකූලතා අවශ්‍යතා අවබෝධ කර ගෙන ඒවාට අනුකූල වන බවට සහතික වීම සහ අවශ්‍ය තාක්ෂණික කුසලතා වර්ධනය අඛණ්ඩව සිදු කිරීමට කටයුතු කිරීම

පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට අනුකූලවීම සඳහා වූ මූලික පියවර